# ශ්‍රී ලංකාවේ රොඩී ජනතාව සතු දේශීය ඥාන පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්

ඒ.වී.එම්.කේ.අංකුඹුර

සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

---

## ABSTRACT

මිනිසාට සිය ජීවිතය පවත්වාගෙන යාමේදී පරිසරය හා සොබා දහම සමග ගැටෙමින්, අරගල කරමින්, අභියෝග ජය ගනිමින් කටයුතු කිරීමට සිදුවේ.මෙකී කාර්යයේදී විවිධාකාරයෙන් සිය පරිසරය ඔස්සේ මිනිසා ලබා ගන්නා අත්දැකීම්, දැනුම, අවබෝධය, කුසලතා ආකල්ප යනාදී සමස්තයේ එකතුව ඔහු සතු දැනුම වශයෙන් හැඳින්වේ.මෙය බොහෝ විට ලේඛනගත වී නැති පරපුරින් පරපුරට කටවහරේ ගලා එන දැනුමකි.මෙම පර්යේෂණයේදී අධ්‍යයනයට ලක්කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන කොටස් අතර ඉතාම ප්‍රාථමික ජන කණ්ඩායමක් වන රොඩී ජනතාව සතු දේශීය ඥාන පද්ධතිය පිළිබඳවයි.

රොඩී ජනතාව අතර පවතින දේශීය ඥාන මූලාශ්‍ර හඳුනා ගැනීමත්, එකී මූලාශ්‍ර සතුව පවතින දේශීය දැනුම හඳුනා ගැනීම හා ඒවා එක් රැස් කිරීමත්, දේශීය ඥාන ස්වරූප එහි ව්‍යුහය හා ඒවා සම්ප්‍රේෂණය වන ආකාරය හඳුනා ගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු වී තිබේ. එසේම රොඩී ජනතාව කොතරම් දුරට සිය දැනුම ප්‍රායෝගිකව භාවිතයට ගනීද යන්න සොයා බැලීමත්, දේශීය දැනුමේ අනාගත පැවැත්ම හා සංවර්ධනය සඳහා එල්ල වී තිබෙන තර්ජන මෙන්ම ලැබී තිබෙන අනුග්‍රහය හඳුනාගෙන සංරක්ෂණ යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම පර්යේෂණයේ සෙසු අරමුණු ලෙස සඳහන් කළ හැක.

අධ්‍යයනයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ රොඩී ජනතාව වාසය කරන ගම්මාන අතරින් වටගොඩ, කනතොලව, පාලුගම, කලුවිලපොතාන යන ගම්මාන හතර නියැදිය වශයෙන් යොදා ගනී. එසේම දත්ත එක්රැස් කිරීමේදී එම ගම්මාන වල සිටින ජනතාව අතරින්ද දේශීය දැනුම සුරැකිව පවතින බවට හඳුනා ගන්නා ලද මූලාශ්‍ර වලින් හා වැඩිහිටි ජනතාවගෙන් තොරතුරු ලබා ගෙන තිබේ.

පර්යේෂණයේදී දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්චා ක්‍රමය, නිරීක්ෂණය ආදිය යොදා ගන්නා අතර තවද අවශ්‍ය අවස්ථා වලදී ද්විතික මූලාශ්‍රද භාවිත කරයි. දත්ත රැස් කිරීමේදී රොඩී ජනතාව සතු දේශීය දැනුම ඔවුන්ගේ සාමාජීය චර්යයා, සෞඛ්‍ය, වෛද්‍ය, හා පෝෂණය, ආර්ථික චර්යයා, සහ භාෂාව හා සාහිත්‍යය යන ක්ෂේත්‍ර ඔස්සේ රැස් කරනු ලැබේ.

මෙසේ රැස් කර ගත් දත්ත ප්‍රධාන වශයෙන්ම ගුණාත්මකව විශ්ලේෂණය කරන ලදී. එහිදී රොඩී ජනතාව සතු දේශීය දැනුම් මූලාශ්‍ර හා එහි ව්‍යුහය, දැනුමේ භාවිතය හා පැවැත්ම, දැනුමේ සංවර්ධනය නව තාක්ෂණය භාවිතය, ප්‍රචාරණය හා අනුග්‍රහය, දැනුමේ සක්‍රීය බව හා දැනුමේ නව ස්වරූප මෙන්ම දේශීය දැනුම සම්බන්ධ ඔවුනගේ ආකල්ප යන ක්ෂේත්‍ර ඔස්සේ දත්ත විශ්ලේෂණය කරයි.
ඒ අනුව රොඩී ජන සමාජයේ පවත්නා දේශීය දැනුම් මූලාශ්‍ර යටපත් වෙමින් පවතින බවත් දැනුමේ භාවිතය සංවර්ධනය හා අනාගත පැවැත්ම දුර්වල වෙමින් පවතින බවත් නිගමනය කළ හැක. එනම් කුල ක්‍රමය පොදු සමාජයෙන් බැහැර වන්නා හා සමගාමීව කුලය හා බැඳී පවත්නා ඉතා වටිනා දේශීය දැනුම් පද්ධතීන්ද අභාවයට යමින් පවතින බව පෙන්වා දිය හැක .

මෙහිදී දැනට සක්‍රීයව පවත්නා දේශීය දැනුම් පද්ධතීන් යටපත් වී යාමට පෙර ඒවායේ සුදුසු සංවර්ධනයන් ඇති කළ යුතු බව පෙන්වා දී තිබේ. එහිදී නවීන තාක්ෂණික පරිසරයන්ට ගැලපෙන පරිදි පවත්නා දැනුමට හානියක් නොවන සේ එම දැනුම නවීකරණය කිරීම, එනම් දේශීය දැනුම සංඛ්‍යාංකකරණයට ලක් කිරීම ආදී ක්‍රියාමාර්ග කාලෝචිත වේ. ඒ සඳහා අවශ්‍ය නව තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිත කිරීම ආදිය පිළිබඳව දැනුම භාවිත කරන්නන් දැනුවත් කළ යුතු අතරම දේශීය දැනුමේ පැවැත්ම හා සංවර්ධනය සිදුවිය හැකි ස්ථාන සොයා බලා ඒවාට රාජ්‍ය මට්ටමින් සුදුසු අනුග්‍රහය හා ප්‍රචාරණය ලබා දිය යුතු බවට යෝජනා කළ හැක.

මූලික පද : දේශීය දැනුම, රොඩී ජනතාව, මානව විද්‍යාව, සංඛ්‍යාංක කරණය, ශ්‍රී ලංකාව